
# ගංකුඩුවේ කැයිරාගං



ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

# නුවර කලාවියේ ජන කවිය

නුවරවැව, කලාවැව, පදවිය වැව යන වැව් තුන ආශ්‍රිත ප්‍රදේශය නුවර කලාවිය යනුවෙන් නම් ලබා ඇත. අතීතයේ සිටම වැව පදනම් කොට ගෙන ගොඩනැගුන නුවර කලාවියේ ජන සංස්කෘතිය සුවිශේෂ ග්‍රාම්‍ය ලක්ෂන වලින් යුක්ත වූවකි. අනුරාධපුරය සිංහලයේ රාජධානිය වූ යුගයෙන් අනතුරුව නුවර කලාවිය දෙවැනිවරට ජනාවාස වන්නේ 1818 හා 1848 යුගයේ සුදු අධිරාජ්‍ය වාදින්ට එරෙහිව ඇති වූ කැරලි හේතුවෙන් මහනුවර හා මාතලේ ආදී ප්‍රදේශ වලින් සංක්‍රමණය වූ ජනතාවගෙනි. මේ පිරිස කැලේ මැද පිහිටි කොටු ගම්මානවල රහසිගත ජීවිත ගත කරමින් ජීවත් වූ නිසා ගොඩනැගුනු සංස්කෘතිය නුමුහුන් එකක් විය. එහෙත් ඔවුන් වැහැරූ බසට ඉතා අල්ප වශයෙන් දමිල වචන හා බැදි ජනවහරේ එන වචන ද මිශ්‍ර වී ඇත්තේ එදා ඔවුන් ආශ්‍රිත ගම්මානවල විසූ දමිල හා වැදි ජනයාගේ ඇසුර නිසා විය හැකිය. මේ හේතුව නිසාම නුවර කලාවියේ ජන වහරද සුවිශේෂත්වයක් ගනී. එම ජනවහර ඔස්සේ ඔවුන්ගේ දුක්ඛ දෝමනස්ස පිළිබිඹු කෙරෙන සුන්දර ජනකවි රාශියක් අපට උරුම වී ඇත. ඒ අතර පැල් කවි, කුරක්කන් කවි, ඇඹරුම් කවි (කුරහන් අඹරන විට කියන කවි) දෑලේ හී පද (දෙදෙනෙකු දෙපසින් සිට කියන කවි) ලෙන්ගතු හී පද (පෙම් කවි) තේරවිලි කවි ආදිය විශේෂයෙන් සඳහන් කල හැක.

නුවර කලාවියේ ජනකවියා සිය කවි ඔස්සේ දුක, සතුට, සාමූහිකත්වය පමණක් නොව උපහාසය වැනි අවස්ථාද අපූරුවට නිරූපණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ජන කවි සාහිත්‍යයේ දැක්වෙන ගැල් කවි හෝ නෙළුම් කවි නුවර කලාවිය තුළ දක්නට නොලැබෙන අතර ඒ වෙනුවට කුරක්කන් හා හේන් වගාවන් ආශ්‍රිත කවි බහුලව දැකිය හැකිය.